# Democracy, Socialization of the Political Culture, and Development of Society

Professor Dharmakeerthi Sri Ranjan
Department of Mass Media
Sri Palee Campus, University of Colombo.
ranjan@spc.cmb.ac.lk

**Abstract**

Democracy, socialization of the political culture, social development, and their legitimacy can be studied as multifaceted complex concepts that have fabricated our consciousness in a divergent and intuitive manner, when considered from the historical perspective of the world. The power and authority of politics, aroused time and again in the zones of European, Western, Asian, African, and middle-east countries have influenced and threatened the forms of the above concepts and their behavior that can be recognized by the academic disciplines in the world. We can identify the practical characteristics of the political development and their constructive cultural and ideological basis with their speedy development of the political socialization process together with the influences of the power and authority of politics and their resultant effects. Herbert Hyman first introduced the concept of "political socialization" in his academic writings in 1959, and it is clear that it has led to a strong focus on those processes (Hyman, 1959). It is high time that we understood the socialization of the scientific and philosophically formalized political process that never creates racial concepts in the minds of the masses but clearly helps to promote the concept of the nation. It is imperative to recognize the importance of being conscious about the formation of national politics and their projects sociologically and psychologically through historical and academic social research and their fundamentals that help to create a practically constructive society, at a time when the world projects of 'dismantling the nation state' are being implemented. It is also important to understand fundamentally that there is a possibility of building a social organization aimed at national development and understanding the directions. It should be understood that the strongest role in these academic writings is not only to create that consciousness in society but also to create them for active purposes. Accordingly, it should be emphasized that the contents here are related to qualitative research methodological approaches, opening up to an experimental direction aimed not only at the socio-historical background but also at theoretical academic explorations.

**Keywords:** Democracy, Political culture, Socialization, Social development.

# ප්‍රජාතන්ත්‍රවාදය, දේශපාලන සංස්කෘතියෙහි සමාජානුයෝජනය සහ සමාජ සංවර්ධනය

මහාචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන්
ජනමාධ්‍ය අධ්‍යයන අංශය
ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය.
ranjan@spc.cmb.ac.lk

**සංක්ෂේපයඃ**

ප්‍රජාතන්ත්‍රවාදය, දේශපාලන සංස්කෘතියෙහි සමාජානුයෝජනය, සමාජ සංවර්ධනය සහ එහි නෛතිකභාවය ආදිය සංකීර්ණ සංකල්ප බවට පත්ව තිබූ අයුරු ලෝක ඓතිහාසික සමාජ ක්‍රමයෙහි සිටම (Historical perspective of world) අධ්‍යයනය කළ හැකි වේ. ඒ අනුව යුරෝපය, බටහිර, ආසියානු, අප්‍රිකානු, සහ මැදපෙරදිග, ආදී කලාපයන්හි වරින්වර ගොඩනැගුණු බල ව්‍යුහයන් සහ එහි අධිකාරියේ ස්වරූපයන් මඟින් මෙම ප්‍රධාන සංකල්ප සහ එහි ක්‍රියාවලීන්ට එල්ල වූ බලපෑම් සරල නොවන බව ශාස්ත්‍රාලයීය ප්‍රවේශ තුළින් අපට හඳුනා ගත හැකි වේ. දේශපාලන සංවර්ධනය, දේශපාලනයෙහි හරයාත්මක සංස්කෘතික සංවර්ධනය සඳහා සහ දේශපාලන සමාජානුයෝජන ක්‍රියාවලියෙහි ධාවක බලවේගයන්හි ප්‍රවර්ධනය සඳහා ප්‍රබල ලෙස බලපානු ලබන බව පසුගිය සියවසේ මැද භාගයේ සිටම අපට ප්‍රායෝගික අධ්‍යනයන් තුළ සිට අපට අවබෝධ කර ගත හැකි වේ. හර්බට් හයිමන් (Herbert Hyman) 1959 දී දේශපාලන සමාජානුයෝජනය (Political socialization) යන සංකල්පය ඔහුගේ ශාස්ත්‍රීය ලේඛන තුළින් ප්‍රථමයෙන් හඳුන්වා දුන් අතර එම ක්‍රියාවලිය සඳහා එමගින් ප්‍රබල අවධානයක් යොමු කිරීමට හේතු වූ බව පැහැදිලි ය (Hyman, 1959). විද්‍යාත්මක සහ දාර්ශනික ලෙස විධිමත් වූ දේශපාලනික ක්‍රියාවලියෙහි සමාජගතකරණය යන්න වාර්ගික සංකල්ප ගොඩ නොනගන අතර එය ජාතිය යන සංකල්පයෙහි ප්‍රවර්ධන ශක්තීන් සඳහා හේතුවන බව අවබෝධ කර ගැනීමට කාලය පැමිණ ඇති බැව් පැහැදිලි වේ. 'ජාතික රාජ්‍යය බිඳ දැමීමේ' ලෝක ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අවධියක ජාතික දේශපාලන සහ එහි ව්‍යාපෘතික හැඩගැස්වීම පිළිබඳ සවිඥානික වීමේ වැදගත්කම ඓතිහාසික ශාස්ත්‍රාලීය සමාජ ගවේෂණ තුළින් හඳුනා ගැනීම වැදගත් වන අතර එය කෘත්‍යාත්මක සමාජ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමට ද මූලික වන බවත්, අප දේශපාලනික වශයෙන් පමණක් නොව සමාජ සහ මනෝවිද්‍යාත්මක දිශානතීන් ඔස්සේ ද තේරුම් ගැනීම තුළ ජාතික සංවර්ධනය අරමුණු කරගත් සමාජ සංවිධානයක් ගොඩනැගීමේ ශක්‍යතාව මේ තුළ තිබෙන බවත් මූලික වශයෙන් තේරුම් ගැනීම වැදගත් වේ. මෙම ශාස්ත්‍රාලීය ලේඛන තුළ ප්‍රබලතම කාර්යභාරය බවට පත් වන්නේ ද එම සවිඥානිකත්වය සමාජය තුළ නිර්මාණය කිරීම පමණක් නොව ඒවා සක්‍රීය අරමුණු දක්වා නිර්මාණය කිරීම බවත් අවබෝධ කරගත යුතු ය. ඒ අනුව සමාජ ඓතිහාසික පමණක් නොව න්‍යායාත්මක ශාස්ත්‍රාලීය ගවේෂණයන් ද අරමුණු කරගත් පර්යේෂණාත්මක දිශානතියකට විවර වෙමින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයන් තුළ මෙහි අන්තර්ගත සඳහන් කළ බව ද අවධාරණය කළ යුතු වේ.

**මුඛ්‍ය පදඃ ප්‍රජාතන්ත්‍රවාදය, දේශපාලන සංස්කෘතිය, සමාජානුයෝජනය, සමාජ සංවර්ධනය.**

**හැඳින්වීම:**

අද්‍යතන ගෝලීය සමාජ ක්‍රමවේදය තුළ දේශපාලනය සහ එහි විවිධ ස්වරූප ආර්ථික සහ සමාජ සංස්කෘතික කරුණු කෙරෙහි පමණක් නොව අනෙකුත් සියලු මානව චර්යාත්මක දිශානතීන් වෙනස් කිරීමට අවශ්‍ය බලගැන්වීම් ඉතිහාසයට වඩා ප්‍රබල ලෙස මේවන විටත් ගොඩනගා ඇති බව පැහැදිලි වේ. ලෝකයෙහි මානව චර්යාත්මක දිශානතිය වෙනස් කරන ප්‍රබල ධාවක බලවේග ලෙස බලය සහ ආර්ථිකය (Power and economy) හඳුනාගත හැකි වේ. අද්‍යතන සමාජයෙහි නව ලිබරල්වාදී සංකල්ප (Concepts of Neoliberalism) මත කේන්ද්‍රගත වන ආර්ථික ක්‍රියාවලියක් දැකිය හැකි වන අතර එයට වෙනස් කළ නොහැකි කිසිවක් නොමැති බව ද ලෝක සමාජ චර්යාත්මක ගතිකයන් මේ වන විටත් පැහැදිලි කොට දී තිබේ. අද්‍යතන ශ්‍රී ලාංකේය දේශපාලන සහ සමාජ ආර්ථික ක්‍රියාවලිය පිළිබඳව විද්‍යාත්මක විශ්ලේෂණයන්හි දී ගෝලීය සමාජ ආර්ථික, සංස්කෘතික සහ දේශපාලනික ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම සහ අවබෝධය අත්‍යවශ්‍ය සාධක බවට පත්වී තිබෙන්නේ ආසියානු සංකල්පයම ගෝලීය ප්‍රවේශය හා සම්බන්ධ වී පවතින බැවිනි. එහෙත් අනාගතයෙහි දී කලාපීයකරණයට අවශ්‍ය ක්‍රමවේද නිර්මාණය වෙමින් පවතින ආකාරය දැකිය හැකි වන අතර එහිදී ඩොලරයෙහි ආධිපත්‍යය බිඳ වැටෙමින් කලාපයෙහි මුදල් ඒකක බලවත් වෙමින් කලාපීයකරණය ලෝකයෙහි ප්‍රබල වීමට අවශ්‍ය ස්වරූප නිර්මාණය වෙමින් තිබෙන ආකාරය ද අප අවධානයට යොමු කළ යුතු වේ.

**පර්යේෂණ ක්‍රමවේදය:**

මෙම ඉහත සංකල්ප විචාරාත්මක ප්‍රවේශයට කේන්ද්‍ර ගත කිරීමේ දී අදාළ ශාස්ත්‍රාලීය ගවේෂණ කාර්ය සඳහා ලෝක දේශපාලන සහ සමාජ සංස්කෘතිකකරණයන් පිළිබඳ අදාළ සාහිත්‍ය විමර්ශන ක්‍රමවේද විද්‍යාත්මක පසුබිමක් තුළ ගොඩනැගිය යුතු බව ද සඳහන් කළ යුතු අතර එහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රම පමණක් නොව ප්‍රමාණාත්මක විශ්ලේෂණ ක්‍රම කෙරෙහි ද අවධානය යොමු කිරීමට සිදු වූ බව ද මෙහිදී අවධාරණය කළ යුතු ය. දේශපාලනික සමාජ සංස්කෘතික සහ අධ්‍යාපනික ක්‍රමවේද පිළිබඳ නිරීක්ෂණය සහ ඒ තුළ ගොඩනැගෙන දැනුම පමණක් නොව අවබෝධය ද කේන්ද්‍රගත කරගනිමින් අනාගත සමාජ ක්‍රමවේදයෙහි ගොඩ නැගීමේ ස්වරූප පිළිබඳව අදාළ චින්තනමය ප්‍රවේශය සඳහා ඓතිහාසික සහ වර්තමාන සමාජ නිරීක්ෂණ ක්‍රම සහ සංකල්පීය සංයුතිකකරණයට අදාළ ගුණාත්මක සහ විශ්ලේෂණක්‍රම ද මෙහි අදාළ ලෙස උපයෝගී කොට ගෙන ඇති බව ද සඳහන් කළ යුතු ය.

**සාකච්ඡාව**

දේශපාලන සංස්කෘතිය, ප්‍රජාතන්ත්‍රවාදය, සමාජානුයෝජනය සහ අධ්‍යාපනය යන්න සරල සංකල්පීය ප්‍රවේශ තුළ විශ්ලේෂණය කළ නොහැකි බවත්, මෙම ඕනෑම සංකල්පයක් ඉතාමත් පොදු සහ තීරණාත්මක සාධක ලෙස විශ්ලේෂණය වන බවත්, එවා නිරන්තරයෙන් සමාජ ක්‍රියාවලිය හා සබැඳෙමින් පුද්ගල සහ

සමාජ ක්‍රමවේදය නව දිශානතියකට යොමු කිරීමට හේතුවන බවත්, මානව චින්තනය සහ චර්යාව හා සබැඳෙන මෙම ප්‍රබල හරයාත්මක සමාජ සංකල්ප (Social concepts) පිළිබඳ ගොඩනගන අවබෝධය සමාජ සක්‍රීයත්වයට හේතු  වන බවත් අප තේරුම් ගැනීම වැදගත් ය. මෙම එක් එක් සංකල්ප නිශ්චිත විෂය කොටස් ඔස්සේ පමණක් නොව ඒ හා සබැඳෙන ශික්ෂණ මාර්ග ඔස්සේ ද නිරන්තරයෙන් එහි ස්වභාවයන් සහ තත්ත්වයන් විශ්ලේෂණය වන බවත්, ඒ තුළ ගොඩනැගෙන අර්ථ කාලික ගතිලක්ෂණ හා ද්‍රව්‍යමය ලෝකයේ හා දැනුම් වර්ධනයෙහි අන්තර්සම්බන්ධිතතාවක් ඇති වන බවත් පැහැදිලි වේ.

මෙම එකදු සංකල්පයක්වත් ඓන්ද්‍රීයව ගොඩ නොනැගෙන බවත්, සමාජ පද්ධතික ව්‍යුහීය ස්වරූප ඒ සඳහා පදනම් නිර්මාණය කරන බවත්, ලොව කිසිම සජීවී හෝ අජීවී භෞතිකයක් හෝ අභෞතිකයක් තනිව හෝ හුදෙකලාව ගොඩ නොනැගෙන බවත්, පොදු නොවූ, කිසිවක් නැති කිසිදු වස්තුවක් හෝ සංකල්පයක් ලෝකයෙහි නොමැති බවත් එහි නියමානුකූලතාවන් මත අප තේරුම් ගත යුතු වේ. ක්‍රියාවෙන් තොර කිසිවක් ලෝකය තුළ දැකිය නොහැකි අතර එහි එකිනෙක ක්‍රියා අන්‍යොන්‍ය වශයෙන් එකිනෙකට තත්වාරෝපනය වෙමින් පෝෂණය වන බවත්, එහි නිරන්තර ගති ස්වරූපය චලිතය වන බවත්, එම චලිතයෙහි ස්වරූප පුද්ගල සහ සමාජ සංවර්ධනය සඳහා බලපානු ලබන බවත්, එහි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තත්ව එහි ප්‍රතිඵල ලෙස ගොඩනැගීමට හේතු වන බවත් විද්‍යමාන තර්කයයි. මෙම එකිනෙක ක්ෂේත්‍ර සහ එහි ගතික පිළිබඳ පරස්පර විරෝධී මතිමතාන්තර ද අප සමාජය තුළ දක්නට ලැබෙන බවත්, ඒවා පිළිබඳ ප්‍රබල දෘෂ්ටීන් සහ මත ලෝක සමාජය තුළ නිර්මාණය වී තිබෙන බවත්, ඒවා හුදෙක් ඔවුන්ගේම මතිමතාන්තර, සංකල්ප, හෝ දෘෂ්ටිවාද ලෙස බැහැර කළ නොහැකි බවත්, එහි යථාර්ථය මෙන්ම ඔවුනගේ යථාර්ථය තුළින් මතුවන අඛණ්ඩ පුද්ගල දැනුම් සහ එහි පද්ධති ගතික විද්‍යාත්මක දෘෂ්ටි ඔස්සේ ද විශ්ලේෂණය කළ හැකි බවත්, එම විශ්ලේෂණ සමාජ ප්‍රගමනය සඳහා හේතු වන බවත් අප අවබෝධ කර ගත යුතු වේ.

ඒ අනුව සමාජය සහ එහි ක්‍රියාවලිය පිළිබඳ පමණක් නොව සමස්ත ලෝකයෙහි මානව සමාජ චර්යාත්මක විධි නියමයන් සහ ගුණාංගයන්ගේ පොදු සහ ආවේනික ගති පිළිබඳව දාර්ශනිකවත් (Philosophically), විද්‍යාත්මකවත් (Scientifically) කියවීම අතිශය වැදගත් වන්නේ ඒ තුළ දැනුමෙන් (Knowledge) ඔබ්බෙහි පවතින අවබෝධය (Realization) ගොඩනගා ගැනීමට හේතු වන බැවිනි. ඒ අනුව සමාජ ඉතිහාසය වර්තමානය තරම්ම සංකීර්ණ නොවූ බවත්,  මිනිසාගේ සංකීර්ණ බව සමස්ත පද්ධතියෙහි සංකීර්ණ බවට හේතු වන බවත්, එම පද්ධතීන් නැවතත් මිනිසාව සංකීර්ණ කරන බවත් අප පැහැදිලි කරගත යුතු වේ.

අද්‍යතන සමාජයෙහි මෙන් නොව ඉතිහාසයෙහි දේශපාලන (Politics) සහ දේශපාලනික සංස්කෘතිය (Political culture) ආදිය විසින් මහජන දෘෂ්ටිවාද සහ එහි ගතිකයන් සියල්ල දේශපාලන දර්ශනය තුළ සංයෝජනය කිරීම සිදු වූ බවත් සමාජ විද්‍යාත්මකව (Sociological), මානව විද්‍යාත්මකව (Anthropological) සහ මනෝවිද්‍යාත්මකව (Psychological) විශ්ලේෂණය කරගන්නා විට පුද්ගල සහ

සමාජ සංවර්ධනය නිර්මාණය කිරීමට හේතු වන සංස්කෘතික උත්තේජන ඒ තුළ ව්‍යුහගත වී ඇති බවත් පැහැදිලි කරගත හැකි ය.

අද්‍යතන ලෝකයෙහි සමාජ පරිවර්තන සහ එහි ස්වභාවයන් මෙන්ම දිශානතීන් ද වේගයෙන් වෙනස් වෙමින් පැවතීම ද දැකිය හැකි ය. ඒ අනුව මෙම සංකීර්ණ සහ ගෝලීය සමාජයට විවර වූ සමාජය පිළිබඳ සංවේදනය අතිශය වැදගත් වන අතරම සමාජය පරාවර්තනය කර ගැනීමේ මුල් ස්වරූප පමණක් නොව සමාජය පරිවර්තනය කර ගැනීමේ ශක්‍යතා ද මේ තුළ ගොඩ නගා ගත යුතු බවත් අප පැහැදිලි කර ගත යුතු වේ. එහෙත් ඒ පිළිබඳ විද්‍යාත්මක දැනුම සහ අවබෝධය වර්තමාන අප සමාජයට තිබේ ද යන ගැටලුව අප තුළ පවතින බවත්, එම ගැටලුවෙන් ව්‍යුක්ත වීම සඳහා ලෝකයෙහි ද්‍රව්‍යමය සමගිය, වස්තු, ක්‍රියාදාමය හා අන්තර් සම්බන්ධිත වූ චින්තන ශක්තීන් පෝෂණය කර ගැනීම අත්‍යවශ්‍ය බවත් පැහැදිලි වේ.

එමෙන්ම, මෙම චින්තන සහ දෘෂ්ටිවාද මත පදනම් වූ දැනුම් පුද්ගල සහ සමාජ සංවර්ධන අවශ්‍යතාවන්ට අනුකූල ලෙස ප්‍රතිපත්ති, මත සහ විශ්වාසයන් ඔස්සේ මානව අත්දැකීම් හා වලංගු භාවයට පත්කර ගනිමින් සක්‍රිය කිරීම අතිශය වැදගත් වනවා පමණක් නොව, එය සංවර්ධනය අරමුණු කරගත් අප සමාජයෙහි ප්‍රබල කාර්ය භාරයක් බවට ද පත්වනු ඇත. පුද්ගල සහ සමාජ සංවර්ධන ක්‍රියාවලියෙහි දී සමාජ ස්ථාවරත්වය (Social stability) ගොඩ නගා ගැනීම අරමුණු කරගත් චින්තන සහ සමාජ ක්‍රියාකාරීත්වය ද නිරන්තර මේ හා සබැඳෙන බව පැහැදිලි ය. සමාජ ස්ථාවරත්වය පමණක් නොව සමාජ චින්තනමය ශක්තීන් පිළිබඳ විශ්වාසය සඳහා ද මෙය වැදගත් වනු දැකිය හැකි වේ. තවද, විශ්වාසය පිළිබඳ චින්තනය යනු ශක්තිය පිළිබඳ විශ්වාසය පමණක් නොවන අතර එය ලෝකය ප්‍රායෝගික කිරීමේ උපකරණයක් බවට ද අවශ්‍ය පදනම ඒ තුළම ගොඩනගා ගැනීම වනු ඇත.

ලෝකයෙහි ප්‍රබලම සමාජ සංකල්ප වන ප්‍රජාතන්ත්‍රවාදය (Democracy), සමාජානුයෝජනය (Socialization) සහ අධ්‍යාපනය (Education) යන්න කිසිදින දේශපාලනික සංකල්පීය කාරණාවලින් ඉවත් නොවන බවත්, එසේ නොවීමට අවශ්‍ය වන දේශපාලනික පදනම මේවන විටත් ලෝකය තුළ ස්ථාපිත වී ඇති බවත් පැහැදිලි ය. එසේම මෙහි සඳහන් සහ අනෙකුත් මානව සංකල්ප ද එකිනෙකින් පෝෂණය වෙමින් සමාජ විඥානය (Social consciousnesses) කේන්ද්‍රීයව පුද්ගල සහ සමාජ චර්යා පද්ධතීන් දක්වා ගලා යන බවත්, ඒ අනුව ලොව කිසිදු සංකල්පයක් මානව සංවර්ධනයෙන් ඉවත් කළ නොහැකි බවත්, ඒ සියල්ල මිනිසාගේ පැවැත්මේ ස්වරූප සඳහා හේතුවන බවත් අප පැහැදිලි කර ගැනීම වැදගත් ය. අනෙක් අතට ලොව කිසිදු සංකල්පයකට තනිව හෝ හුදෙකලාව පැවතිය නොහැකි බවත්, එහි අන්තර් සම්බන්ධීතාව පුද්ගල සහ සමාජ විඥනය පෝෂණය කරන බවත් අපට අවබෝධ කර ගත හැකි වේ.

අනෙක් අතට දෘෂ්ටිය යන්න පුද්ගල විඥානයෙහි හරය වන බවත්, එය පුද්ගල සහ සමාජ අධ්‍යාත්මය හැඩගැස්වීම සඳහා ප්‍රබල මෙහෙයක් වන බවත්, එහි ප්‍රබල කාර්ය භාරයක් පවතින බවත් අප පැහැදිලි කර ගත යුතු වේ. දේශපාලනය තුළ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ දෘෂ්ටිය අතිශය වැදගත් වන අතර එය අධ්‍යාපනය සහ අනෙකුත් මානව චර්යාත්මක කාරණා කෙරෙහි ද ප්‍රබල බලපෑම් සිදුකරන බවත්, එහි

ඓතිහාසික විකාශනය සහ පොදු නියමයන් මූලික වූ විද්‍යාත්මක සහ සමාජ සංවර්ධන නියමයන් ගැන දැනුම මූලිකව අපට හඳුනාගත හැකි ය. ලෝකය තේරුම් ගැනීමේ දී ද ද්‍රව්‍ය, වස්තු, ක්‍රියාදාම පමණක් නොව එහි ප්‍රපංචාත්මක ස්වරූප (Phenomenological approach) ද එකිනෙකට අන්තර් සම්බන්ධිත බවත්, එම අන්තර්ක්‍රියාකාරීත්වයෙහි ස්වරූප එකිනෙක හා තත්වාරෝපනය වන බවත්, ඒවා සියල්ල චලිතයෙහි පදනම මගින් ගොඩනැගෙන බවත්, ඒ නිසා සත්‍ය සහ ඒ පිළිබඳ ප්‍රජානන විධි සහ ව්‍යවහාර ඒ සඳහා හේතු වන බවත් අප තේරුම් ගත යුතු ය. මෙම සෑම සංකල්පයක් සහ චර්යා පද්ධතියක්ම එකිනෙකට ආවේනික වූ ප්‍රවණතා සහ ප්‍රතිවිරුද්ධතා මගින් වෙනස් වීම්, වර්ධනය වීම් සහ පරිවර්තනය වීම් ද සිදුවන බවත් දැකිය හැකි ය. ඒ අනුව අධ්‍යාපනඥයාගේ මෙන්ම දේශපාලනඥයාගේ ද ප්‍රබල වගකීම වන්නේ ලෝකයෙහි සමාජ පරිවර්තනයන්, එහි වර්ධන නියමයන් සහ පාලන නියමයන් පමණක් නොව, ගැටලු, වැඩකරන ආකෘති සහ නියමයන් මෙන්ම එහි දැනුම් සමස්තය පිළිබඳව විද්‍යාත්මක දෘෂ්ටීන්ට සහ විධි නියමයන්ට අනුව අවබෝධය ගොඩ නගා ගැනීමයි. එහෙත් ශ්‍රී ලාංකේය අධ්‍යාපනඥයා, දේශපාලනඥයා මෙන්ම සමාජ වගකිව යුත්තන් ද ඒ පිළිබඳවත්, සමාජ සංවර්ධන ක්‍රියාවලීන් හෝ එහි ඉලක්ක පිළිබඳවත්, බොහෝ දුරට අනවබෝධිතව ක්‍රියාත්මක වන බවත් පැහැදිලි ය.

ප්‍රජාතන්ත්‍රවාදය (Democracy) යන්න සරල සංකල්පීය ක්‍රියාවලියක් නොවන බවත්, එය පුලුල් මානවීය පදනමක් ගොඩනගන චර්යාත්මක පද්ධතියක් බවත්, එය එකිනෙකා හමු වීමට අවශ්‍ය මානව පදනම ද ගොඩනගන බවත් අප අවබෝධ කරගත යුතු ය. එය මානව සමාජයෙහි ප්‍රධාන සිද්ධීන් සහ ක්‍රියාදාමයන් පදනම් වූ මූලධර්මයක් පමණක් නොව විධි නියමයක් බවට ද පත්ව ඇති බවත් තවද පැහැදිලි වේ. මෙහි Demos යනු ප්‍රජාව (People) යන්න වන බවත්, kratos යනු (Rule) පාලනය යන්න වන බවත් ඒ තුළින් ප්‍රජාතන්ත්‍රවාදය යන්න ප්‍රබල මානවීය සංකල්පයක් වන බවත් පැහැදිලි ය. ඒ පිළිබඳ වර්තමාන වගකිව යුතු බොහෝ ආයතන ප්‍රජාතන්ත්‍රවාදය හෝ එහි ක්‍රියාවලිය පිළිබඳව ගැඹුරු අවබෝධයකින් තොරවන බවත්, සමාජයට ද ප්‍රජාතනත්‍රවාදය පිළිබඳ ගැඹුරු අවබෝධයක් තිබිය යුතු බවත්, එහෙත් එවැනි අවබෝධයක් සමාජයටත් නොමැති බවත්, සමාජ පැවැත්මේ සහ ආයතනික ක්‍රියාන්හි දී ඒ පිළිබඳ දුගී බව තවද පැහැදිලි වන බවත් වර්තමාන ස්වරූප තුළ දැකිය හැකි ය. එසේම දේශපාලන පක්ෂ ගණනාවක් පැවතුනත් ඒවායෙහි භාවිතය සම්බන්ධයෙන් ද ප්‍රමිතකරණයක් නොමැත්තා වූ ලෝකයක අපගේ මතය වුව දැක්වීමේ දුෂ්කරතා ද පවතින බවත් අපට අවබෝධිත ය.

ප්‍රජාතන්ත්‍රවාදයෙහි පැවැත්ම සඳහා හේතු වන තවද ප්‍රබල සංකල්ප දෙකක් දැකිය හැකි වන අතර එය සංකල්පීය ලෙස 'රජය' සහ 'ආණ්ඩුව' යනුවෙන් ද හඳුනාගත හැකි ය. මෙම සංකල්ප දෙක අතර ක්‍රියාකාරීත්වය ද එකිනෙකින් ව්‍යුක්ත කළ නොහැකි බවත් 'රාජ්‍යය' සහ 'ආණ්ඩුව' යන යෙදුම් සමාන නොවන බවත්, එය සමාන පද ලෙස භාවිතා නොකළ යුතු බවත් අප පැහැදිලි කර ගැනීම වැදගත් ය. මෙම සංකල්ප සමාජ සහ දේශපාලන ක්‍රියාවලියෙහි දී ඉතා ප්‍රබල වන බවත්, එහි සක්‍රීයත්වය අත්‍යවශ්‍ය බවත්, ආණ්ඩුවෙහි සක්‍රීයත්වය රාජ්‍ය පැවැත්ම කෙරෙහි ප්‍රබලව බලපානු ලබන බවත්, ආණ්ඩුවෙහි භෞතිකවාදී සහ චර්යාත්මක ගති නියමයන් රාජ්‍ය ස්වරූප සඳහා හේතු වන බවත්, ආණ්ඩුවෙහි සියලු අධිකාරීන් සහ කාර්යයන් රාජ්‍යය වෙනුවෙන් ක්‍රියාත්මක වන බවත්, 'රාජ්‍යය' නියෝජනය කරන්නේ

ආණ්ඩුවට වඩා එහි පුළුල් සහ ස්ථාවර නියමයන් මූලිකව බවත් අපට පැහැදිලි වේ. සැබෑ ප්‍රායෝගිකත්වය මෙම සංකල්පයන්හි මූලික ලක්ෂණ වන බවත්, රාජ්‍ය යන්න ආණ්ඩුවට වඩා ස්ථාවර බවත්, ජනතාව අතර අධිකාරිය බෙදා හරින ආකාරය හෝ පවරන ආකාරය කාලයත් සමඟ විවිධ රටවල විවිධ අනුපාතවලින් වෙනස් වී ඇති බවත්, මෙහි ප්‍රධාන ප්‍රවේශ අතරට රැස්වීමේ නිදහස, ආශ්‍රය කිරීමේ සහ කතා කිරීමේ නිදහස, සමානාත්මතාවය, පුරවැසිභාවය, පාලනය කරන අයගේ කැමැත්ත, ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය, ජීවත්වීමේ හා නිදහසේ අයිතිය සහ සුළුතර අයිතිවාසිකම් අනවශ්‍ය ලෙස රජය විසින් අහිමි කිරීමෙන් නිදහස් වීම ආදිය ඇතුළත් වන බවත් දැකිය හැකි ය.

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සංකල්පය කාලයාගේ ඇවෑමෙන් සැලකිය යුතු ලෙස වෙනස් වී ඇති බවත්, ප්‍රජාතන්ත්‍රවාදයේ මුල් ස්වරූපය ඍජු ප්‍රජාතන්ත්‍රවාදයක් බවත්, එය ජනතාවගේ මූලික නිදහස සහ මූලික අයිතිවාසිකම් ආරක්ෂාකරන බවත් අවබෝධ කරගත හැකි ය (Bellini, 2019). ප්‍රජාතන්ත්‍රවාදය යන්න දේශපාලන සංකල්පයක් සහ ආණ්ඩු ක්‍රමයක් ලෙසත් ඒ සඳහා පැරණි ඉතිහාසයක් ඇති බවත් පැහැදිලි ය (Aristotle, 1944). වර්තමානයෙහි ප්‍රජාතන්ත්‍රවාදයෙහි දැකිය හැකි වඩාත් සුලභ ආකාරය වන්නේ පාර්ලිමේන්තු හෝ ජනාධිපති ප්‍රජාතන්ත්‍රවාදයක් බවත්, එය ඔවුන් වෙනුවෙන් පාලනය කිරීම සඳහා ජනතාව විසින්ම රාජ්‍ය නිලධාරීන් තෝරා පත් කර ගන්නා නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයක් බවත්, නීත්‍යානුකූලභාවය, යුක්තිය, නිදහස හා බලය යනාදිය ප්‍රජාතන්ත්‍රවාදයෙහි ප්‍රධාන ලක්ෂණ බවත් පැහැදිලි ය (Tangian, 2020).

ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රචලිත එදිනෙදා තීරණ ගැනීම බහුතර රීතිය (Majoritarianism - a traditional political philosophy or agenda) මත පදනම් වුවත් බහුතරය පමණක් නොව සම්මුතිය වැනි සාධක තීරණ ගැනීමේ ප්‍රවේශයන් සඳහා ප්‍රජාතන්ත්‍රවාදයට අත්‍යවශ්‍ය බවත් පැහැදිලි වේ. බහුතරවාදය ප්‍රති තුළනය කිරීම සඳහා බොහෝ දුරට ව්‍යවස්ථාමය පදනමින් ප්‍රමුඛත්වය ගනු ලබන (Legitimacy on sensitive issues) අතර ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ (Liberal democracy) පොදු ප්‍රභේදය තුළ, බහුතර බලතල නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ (Representative democracy) රාමුව තුළ ද ක්‍රියාත්මක වනු දැකිය හැකි බවත් පැහැදිලි ය. ව්‍යවස්ථාව මගින් බහුතරය සීමා කර සුළුතරය ද ආරක්ෂා කරනු ලබන බවත්, පුද්ගල අයිතිවාසිකම් භුක්ති විඳීම ද මේ තුළින් සිදු වන බවත් පැහැදිලි ය (Watkins, 1970).

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සාමාන්‍යයෙන් නිර්වචනය වන්නේ ඡන්දය දීමෙන් බව වටහා ගත්ත ද, ඒ පිළිබඳ නිශ්චිත නිර්වචනයක් පිළිබඳ සම්මුතියක් තවමත් ගොඩනැගී නොමැති බවත් පැහැදිලි ය (Watkins, Frederick (1970). කාල් පොපර් (Sir Karl Raimund Popper, 1902 – 1994) පවසන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සම්භාව්‍ය දැක්ම ඉතා සරලව පෙන්වා දුන හොත්, ප්‍රජාතන්ත්‍රවාදය යනු ජනතාවගේ පාලනයක් වන අතර, ජනතාවට පාලනය කිරීමට අයිතියක් ඇත යනු එහි න්‍යායාත්මක එළඹුම වන බවයි. "විවෘත සමාජය සහ එහි සතුරන්" ("The open society and its enemies") යන ලිපිය තුළ ඔහු යෝජනා කරන්නේ ද සම්පූර්ණයෙන්ම නව ගැටලුවක් යන්න හඳුනාගැනීමේ දී එය තාර්කික දේශපාලන න්‍යායක මූලික ගැටලුවක් ලෙස හඳුනාගත යුතු බවයි (Popper, 1988).

කොෆි අනන් (Kofi Atta Annan 1938 – 2018) වරෙක ප්‍රකාශ කරන්නේ ද ලෝකයේ ප්‍රජාතාන්ත්‍රීය ලෙස ජාතීන් ජීවත් වන තරමටම ප්‍රජාතන්ත්‍ර ක්‍රමවේදයෙහි ද විවිධ ස්වරූප ද ගොඩනැගෙන බවයි. ප්‍රජාතන්ත්‍රවාදය නිවැරදි ලෙස අර්ථවත් වීමට නම් එම ප්‍රජාවට හෝ ඕනෑම සමාජයකට එහි සමාජ, ජීවන ක්‍රමවේද, සාමූහික විඥනික ක්‍රම (Collective consciousness), එහි ගොඩ නැගෙන සමාජ සංස්කෘතික සහ සමාජ සංවර්ධන ස්වරූප පිළිබඳව පමණක් නොව ගෝලීය දේශපාලනය සහ එහි සමාජ ක්‍රමවේද (Global politics and social systems) පිළිබඳව ද නිවැරදි දැනුම සහ අවබෝධය තිබිය යුතු වේ. එයට ප්‍රබල හේතුව වන්නේ ඉතිහාසයෙහි පැවති සමාජයට වඩා භුගෝලීය සීමා අතික්‍රමණය කරමින් විශ්ව ගම්මාන ස්වරූප දක්වා අප ගොඩ නැගෙමින් තිබෙන නිසා පමණක්ම නොව, එහි ආර්ථික සහ බලය (Economy and power) පදනම් කොට ගෙන සමාජයෙහි එකිනෙකා පිළිබඳ බලපෑම් ද ප්‍රබල වී ඇති බැවිනි. එමෙන්ම අද්‍යතනයෙහි අප ගෝලීය සමාජ, ආර්ථික, දේශපාලනික ආදී සියලුම දිශානතීනට ව්‍යුහගත වී ඇති බවත් ඒ තුළ අප අපගේ සමාජ ඉතිහාසයටත් වඩා අප පරාරෝපනය (Alienation) වී ඇති බවත්, එහි ප්‍රතිඵල ලෙස අප අපටම අහිමි වී ඇති බවත් තේරුම් ගැනීම වැදගත් ය.

අනෙක් අතට අද්‍යතන භූ දේශපාලන තරගයේ ජාත්‍යන්තර පර්යාය තුළ ප්‍රජාතන්ත්‍රවාදයේ භූමිකාව සහ එහි බලපෑම පිළිබඳව ගොඩනැගෙන්නේ ද ප්‍රබල අරගලයක් බවත්, එම අරගලය කෙටි කාලීන නොවන බවත් පැහැදිලි ය. මෙම ස්වරූප සහ එහි ගතිකත්වය 2008 ගෝලීය මූල්‍ය අර්බුදයේ සිට වේගයෙන් දිග හැරී ඇති බවත්, ලෝකයෙහි ජාත්‍යන්තර පද්ධතියෙහි මහා බලවතුන් අතර තරගය ද අනාගත ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවයට වඩාත් ප්‍රබල ලෙස බලපෑම් කරන බවත් පෙනේ. ඇමෙරිකාව, රුසියාව, ඉන්දියාව සහ චීනය යන රටවල් විවිධ ක්‍රම භාවිත කරමින් සහ විවිධ ශක්තියෙන්, අරමුණු තුනක් සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරනු ලබන බව ද අප පැහැදිලි කර ගත යුතු ය. එනම් ඔවුන්ගේ

1. කලාපවල මිලිටරි හා ආර්ථික බලපෑම් ක්ෂේත්‍ර වර්ධනය කර ගැනීම.
2. තමන්ගේම අභ්‍යන්තර නීත්‍යානුකූලභාවයට අභියෝග කරන ප්‍රජාතන්ත්‍රවාදී සහ අනෙකුත් ආයතන සහ සම්මතයන් දුර්වල කිරීම.
3. ජාත්‍යන්තර පර්යායේ ආධිපත්‍යය ශක්තිමත් කර ගැනීම සහ අන්‍යයන්ගේ ශක්තීන් හීන කිරීම.

යනාදී වශයෙනි.

මෙම තීරණාත්මක සහ භූ දේශපාලනික සන්ධිස්ථානයන්හි දී, ලෝකයෙහි බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් සහ එහි අන්තර් සම්බන්ධිත දේශීය අභියෝග සමූහ දේශපාලනික, ආර්ථික සහ සංස්කෘතික වශයෙන් ප්‍රබල ආතතීනට ද ලක්ව ඇති බවත් අවබෝධ කර ගැනීමට කාලය පැමිණ තිබේ. ලොව පුරා ප්‍රධාන කලාප සහ රටවල් අකාර්යක්ෂම පාලනය, ආර්ථික අසමානතාවය, සහ ආර්ථිකයෙහි අසමත් බව මෙන්ම සමාජ-සංස්කෘතික නැගිටීම් සහ දේශපාලන අවිඥනික බව පමණක් නොව අසත්‍ය ස්මතු වීමත්, සත්‍යයෙහි මිය යාමත් ආදී වශයෙන් දිගු කාලීන අභියෝගවල කූටප්‍රාප්තිය නිසා ගොඩනැගුණු ප්‍රජාතන්ත්‍රවාදී ලිබරල්වාදයේ (Democratic liberalism) අවපාතයන් ද භුක්ති විඳිමින් සිටී. බටහිර සහ යුරෝපා දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රටවල් අතර පසුබෑම යනු ද ලිබරල්වාදයේ අර්බුදයක් තුළින් ගොඩ නැගෙන

අතර, එහි ආර්ථික දුක්ගැනවිලි සහ අනන්‍යතාව පදනම් කරගත් අරගල හේතුවෙන් දෘෂ්ටිවාදාත්මක වශයෙන් වම සහ දකුණ යන දෙකෙහිම ජනප්‍රියවාදී ස්වරූප තුළ ගොඩනැගෙන අධිකාරීවාදී ප්‍රවණතා දැකිය හැකි ය. පාකිස්තානයේ අගමැති ඉම්රාන් ඛාන්, සම්භාව්‍ය ජනප්‍රියවාදී වේදිකාවක් මත බලයට පත් වූ අතරම ඔහුගේ දේශීය ප්‍රතිපත්ති වේදිකාව සමාජ සේවා සැපයීම සහ පාකිස්තානයේ දුප්පත්කම කෙරෙහි අවධානය යොමු කිරීම ආදිය සෘජුවම වාමවාදී ප්‍රවේශ තුළ ගොඩනැගෙනු දැකිය හැකි වූ අතර විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වුව ද, පාකිස්තානය බටහිර මත යැපීම අවම කර නැගෙනහිර දෙසට හැරීමේ ඔහුගේ අභිලාෂය ස්වෛරී ජාතිකවාදයේ වාම සන්නාමය පැහැදිලි කිරීමට ද සමත් වී තිබේ.

අනෙක් අතට බොහෝ දුරට නැගී එන සහ බටහිර නොවන ප්‍රජාතන්ත්‍රවාදී රටවල, දූෂණ සහ ප්‍රචණ්ඩ අපරාධ අවම කිරීමට ආණ්ඩු අපොහොසත් වන බව දැකිය හැකිවනවා පමණක් නොව එහි අභ්‍යන්තර අභියෝග වඩාත් කැපී පෙනෙන අයුරින් ගොඩනැගෙන බවත්, සංවර්ධනයට අදාළ සන්නිවේදනයෙහි කාර්ය බිඳ වැටෙන බවත් පැහැදිලි ය. ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසුව නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්හි අභ්‍යන්තර දේශපාලන, ආර්ථික සහ සමාජ දුර්වලතා සමග අරගල කර ඇතත් එහි අනවබෝධිත ස්වරූප මත තවමත් එවැනි වැරදි වඩාත් උග්‍ර වෙමින් පවතින බවත් අප පැහැදිලි කර ගත යුතු වේ.

බොහෝ රටවල ආර්ථික හා දේශපාලන ආතතීන්ගේ පසුබිමක, ලිබරල් සහ ඒකාධිපති නායකයින් මැතිවරණ ක්‍රියාවලීන් මගින් බලය ලබා ගනිමින් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී (Liberal democracy) සම්මතයන් ඇතුළතින් දුර්වල කිරීමට ද උත්සාහ ගනිමින් සිටින බවත්, ලිබරල් සහ අධිකාරීවාදී නැඹුරුවක් ඇති පුද්ගලයින් සහ පක්ෂ සහ අදහස්වල ද ප්‍රබල තරගයක් පමණක් නොව බල තරගයක් ද දැකිය හැකි බවත්, සමාජ සංවර්ධන සැළසුම් ඒ තුළ ඉදිරිපත් නොවීමත් දැකිය හැකි ය. බටහිර, යුරෝපා සංගමය සහ නේටෝව තුළ ද ලිබරල් සහ නව අධිකාරීවාදී අභියෝග ඉදිරියෙන්ම නියෝජනය කරනු දැකිය හැකි ය. මෙම ලිබරල් බලවේගවල සාර්ථකත්වය ඉස්මතු කරන්නේ ලිබරල් මූලධර්ම පුද්ගල නිදහස ප්‍රවර්ධනය කරන අදහස්, සහ විධායකය පිළිබඳ ව්‍යවස්ථාදායක සහ අධිකරණ පරීක්ෂාවන් ජනප්‍රිය කැමැත්ත ප්‍රතිපත්ති බවට පරිවර්තනය කරන මැතිවරණ වැනි ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් ද කේන්ද්‍රීයව ය.

ජනමත විචාරණ ද බොහෝ විට ජනතාවාදී අධිකාරීවාදීන් බලගන්වන මෙවලම් ලෙස ද සැලකිය හැකි අතර ගෝලීය වශයෙන්, ප්‍රජාතන්ත්‍රවාදී පසුබෑම, ජනප්‍රිය ඡන්ද භාවිතය වැඩි වීමත් සමග සමපාත වී ඇති බැව් ද පැහැදිලි ය. කෙසේ වෙතත්, ප්‍රජාතන්ත්‍රවාදී විසංයෝජනය සහ ජනමත විචාරණ සංඛ්‍යාව ඉහළ යාම අතර සම්බන්ධය ද අද්‍යතනයෙහි ප්‍රබල ය. ජනමත විචාරණ යනු ලිබරල් නායකයින් තෝරා ගැනීමේ ඵලදායී යාන්ත්‍රණයක් දැයි පැහැදිලි ද නැත. මෙම භූමිකාවන් අතර වෙනස හඳුනා ගැනීම සඳහා කේන්ද්‍රීය වන්නේ ජනමත විචාරණවල ආයතනික සීමාවන් සහ ඒවා යොදවා ඇති දේශපාලන සන්දර්භය බව ද අප පැහැදිලි කර ගත යුතු ය.

මෙම නව ලිබරල් සහ තාක්‍ෂණික ක්‍රමවේදයෙහි ප්‍රතිඵල ලෙස සංවර්ධනය වෙමින් පවතින කාර්මික ලෝකය පුරා තරගකාරී කලාප ද මතු වෙමින් තිබෙන බව පැහැදිලි ය. එය දේශපාලන, ආර්ථික සහ

මිලිටරි මෙවලම් ඇතුළත් වන බලපෑම් තරගයක් වන අතර එය වඩ වඩාත් ඩිජිටල්කරණය (Digitalization) වෙමින් ද පවතී.

ගෝලීය වශයෙන්, ඇමෙරිකාව, රුසියාව සහ චීනය ආදී රටවල් විසින් ක්‍රියාවට නංවන ලද ඩිජිටල් අධිකාරීවාදය (Digital authoritarianism) සඳහා වන මෙවලම් බොහෝ රාජ්‍යයන්හි නව අනාගතය සඳහා අභියෝග මාලාවක් සහ තරගකාරීත්වයන් ද ගොඩනගනු දැකිය හැකි ය. මෙම නව සන්නිවේදන සංසිද්ධීන් එනම් ඉලෙක්ට්‍රොනික ප්‍රජාතන්ත්‍රවාදය සහ විද්‍යුත් රජය සහ එහි අන්තර්ජාල ප්‍රවේශය මගින් ගොඩනගන ප්‍රවේශ සහ එහි ප්‍රභාෂාව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය සහ එම මාර්ගය යන දෙකෙහිම ක්‍රියාකාරීත්වය වෙනස් කිරීමේ නියෝජිතයෙකු වීමට ඇති හැකියාව ප්‍රබල බවත්, එමගින් ආර්ථික, සමාජීය සහ දේශපාලනික වශයෙන් සිදු කළ හැකි බලපෑම් සරල නොවන බවත් පැහැදිලි ය. මොස්කව් යුරෝපය පුරා සහ එක්සත් ජනපදයේ සයිබර් ප්‍රහාර සහ සාවද්‍ය තොරතුරු ව්‍යාපාර වැනි සාම්ප්‍රදායික නොවන මෙවලම් මේ සඳහා නිදසුන් වේ. චීනයේ අවධානය මූලික වශයෙන් දේශීය වන අතර, එහි දේශීය ජනගහනය පාලනය කිරීමට සහ නිරීක්ෂණය කිරීමට බලවත් ඩිජිටල් මෙවලම් ද භාවිතා කරයි. එමෙන්ම අනාගතයෙහි දී චීනය ඩිජිටල් අධීක්ෂණය සහ වාරණය සඳහා වන නව තාක්ෂණයන්ගෙන් වැඩි පිටුබලය ගොඩනගන අධිකාරීවාදී ආකෘතියක් ගොඩනැගීමට ද යම් දිනක ඔවුන් උත්සාහ දරනු ලැබිය හැකි බව ද පැහැදිලි ය. කෘත්‍රිම බුද්ධියේ දියුණුව පදනම්ව ගොඩනැගෙන අභියෝග ඉදිරි වසරවල දී වඩාත් ප්‍රබල වනු ද දැකිය හැකි ය.

ඩිජිටල් අධිකාරීවාදය දේශීය හා විදේශීය ජනගහනය නිරීක්ෂණය කිරීම, මර්දනය කිරීම සහ හැසිරවීම සඳහා ඩිජිටල් තොරතුරු තාක්ෂණය භාවිත කිරීම මගින් ප්‍රජාතන්ත්‍රවාදය සහ අත්තනෝමතිකත්වය අතර බල තුළනය නැවත මේ තුළ ගොඩනගා ගනු ඇත.

බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී රටවල් ඩිජිටල් අධිකාරීවාදය ඉදිරියට ගෙන යන තාක්ෂණයන් මත අපනයන පාලනයන් දැඩි කළ යුතු බවත්, ආනයනයන් ලිබරල් සංස්කෘතියකට අනුගත කළ යුතු බවත්, ඩිජිටල් අධිකාරීවාදයේ නියැළෙන තන්ත්‍ර අනුමත කිරීම සහ ඒවා සපයන සමාගම්, චර්යාධර්ම පද්ධතියක් සමඟ ඩිජිටල් පාලනයේ තරගකාරී ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතියක් වර්ධනය කිරීම සඳහා මහජනතාව වැඩි කළ යුතු බවත් අවබෝධ කර ගැනීමට උත්සාහ ගනිමින් සිටින බව ද පැහැදිලි ය. තරුණයින් අතර ඩිජිටල් චින්තන සහ විවේචනාත්මක කුසලතා ගොඩනැගීම සඳහා චර්යාත්මක සහ අධ්‍යාපනික වැඩසටහන් සඳහා අරමුදල් සැපයීම ඇතුළුව තොරතුරු හැසිරවීම පිළිබඳ දැනුවත් කිරීම් ද මේ තුළ ගොඩනැගීමට කටයුතු කරන බවත් ඒ තුළ ජාලගත සම්ප්‍රදායක් නිර්මාණය කිරීමට උත්සාහ ගන්නා බවත් පැහැදිලි ය.

ප්‍රජාවට දැනුම නොමැතිව යම් රටක හෝ සමාජයක ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේද ක්‍රියාත්මක වන්නේ නම් එවැනි සමාජ තුළ කෘත්‍යාත්මක ක්‍රමවේදවලට වඩා සමාජ දුෂ්කෘත්‍යාත්මක ස්වරූප (Dysfunctional approaches) ගොඩනැගෙන බව ද අප පැහැදිලි කරගත යුතු වන්නේ පාලන තන්ත්‍රය ප්‍රජා තීරණය මත ගොඩ නැගෙන බැවින් සහ දේශපාලනඥයින් ජනතා නොදැනුවත් කම මැනවින් තේරුම් ගන්නා බැවිනි. ඒ අනුව දේශපාලන ක්‍රමවේද සහ අධ්‍යාපනය යනු නැවත ද සරල සංකල්පීය ප්‍රවේශ සංයුක්ත කරන

ක්‍රමවේදයක් නොවන බව ද පැහැදිලි ය. දේශපාලන, ආර්ථික සහ සමාජ ක්‍රමවේද යනු එකිනෙකින් වියුක්ත නොවන බවත් මේවා එකිනෙක සමාජානුයෝජනය වෙමින් පැවැත්ම හෝ බිඳ වැටීම මෙම එකිනෙක සාධක හා අනුව සම්බන්ධ වන බවත් අප නිරන්තරයෙන්ම පැහැදිලි කරගත යුතු වේ. ඒ අනුව ඕනෑම සමාජයක ස්ථාපිත විය යුතු දේශපාලන නිදහස (Political freedom) සහ ආර්ථික නිදහස (Economic freedom) මානව සමෘද්ධියේ (Human prosperity) සහජීවන නිවුන් කුළුණු (Symbiotic twin pillars) වන අතර කල් පවතින සාර්ථක ජාතීන් සඳහා අත්‍යවශ්‍ය පදනම් (Indispensable foundations) මේ තුළ ගොඩනන්වනු දැකිය හැකි වේ.

අව්‍යාජ සහ තිරසාර සංවර්ධන ප්‍රගතිය සඳහා පුද්ගලික දේපල සහ වෙළඳපොල ආර්ථිකයක් (Market economy) අද්‍යතන සමාජය තුළ අත්‍යවශ්‍ය සාධක බවට ද පත් වී තිබෙන්නේ දේශීය සක්‍රීය ආර්ථික දිශානතියක් ගොඩ නොනැගීමත් ඩොලරයෙහි ආධිපත්‍යයට යටත් වීමත් නිසා ය. නිදහස් වෙළෙඳ පොළ ක්‍රමවේදය (Open economic system) සමාජ සංස්කෘතික සහ දේශීය අන්‍යතා පදනම්ව හැසිරවිය යුතු ආකාර පිළිබඳව තවමත් නිවැරදිව තේරුම් නොගැනීමේ ගැටලුව ද අප අතර පවතින බවත්, නිදහස් වෙළෙඳ පොළ ක්‍රමවේදය යන සංකල්පය පිළිබඳව බොහෝ දෙනෙකු ගැටලු නිර්මාණය කොටගෙන ඇති බවත්, ඒ පිළිබඳ සෑම තැනකම නොදැනුවත් බවෙහි ඉස්මතු වීම ද එයට සමගාමීව දැකිය හැකි බවත් පැහැදිලි ය.

දෙවනුව, සමාජවාදය යන්න ප්‍රජාතන්ත්‍රවාදයට සමානව ප්‍රතිවිරෝධී වුවත් (Antithetical to democracy), රාජ්‍ය බලය සීමා කිරීමත් (Limit the power of the state), සිවිල් නිදහස ආරක්ෂා කිරීමත් (Protect civil liberties) සඳහා දිගු කාලීනව, පුද්ගලික දේපළ සහ සාධාරණ ලෙස නිදහස් වෙළඳපොළ ක්‍රමවේදය ද අවශ්‍ය බවත් පැහැදිලි ය.

තෙවනුව, ප්‍රජාතන්ත්‍රවාදය යනු මානව සමෘද්ධිය ලබා දීම (Delivering human prosperity) සඳහා හොඳම ක්‍රමයක් ලෙස ද මේ වන විටත් ලෝකයේ සමෘද්ධිමත් රටවල් අවබෝධ කරගෙන සිටිනු දැකිය හැකි වේ. අනෙක් අතට, ප්‍රජාතන්ත්‍රවාදය සහ සමෘද්ධිය යනු නිවැරදි පාලනයක් ගොඩනැගීමේ ක්‍රියාවලියෙහි (Process of good governance) තීරණාත්මක විචල්‍යයන්හි අන්තර් සම්බන්ධතාවන්හි (Intervening variables) මැදිහත්වීමේ ස්වරූපයයි. විනිවිදභාවය (Transparency), රීතිය, නීතිය (Rule of law), දිරිමත් කරන රාජ්‍ය නියාමන පරිසරයක් (State regulatory environment) ආයෝජන සහ නවෝත්පාදනවලට අදාළ පරිසරය (Encourages investment and innovation) ද ගොඩනන්වයි. සිංගප්පූරුව වැනි රාජ්‍ය තුළ ද බොහෝ දුරට ප්‍රජාතන්ත්‍රවාදයට වඩා තම රටෙහි පොහොසත් බව සඳහා නිවැරදි පාලන ක්‍රමවේදය සාක්ෂාත් කර ගැනීම ද දැකිය හැකි වූ අතර සමහර රටවල් සංවර්ධනය සඳහා එම සූත්‍රය නැවත භාවිත කිරීම ද දැකිය හැකි විය.

තවද, විවෘත දේශපාලන හා මතවාදී තරගයක් නොමැතිකම (Absence of political and ideological competitions) නිසා ද සිවිල් අයිතිවාසිකම් (Civil rights) සහ දේපල අයිතිවාසිකම්

(Property rights) යන දෙකම අවභාවිත කරමින් (Abusing) ආණ්ඩු නරක අතට හැරීමට ද නැඹුරු වී ඇති බව ද අද්‍යතන ලෝකය පිළිබඳ අවධානය යොමුකරන විට පැහැදිලි ය.

ලෝකයෙහි මානව සමෘද්ධිය සහ ධනය ගොඩනැගීමෙහි මානව ප්‍රවේශ බවට පත්වන්නේ වැඩ කිරීමට දිරිගැන්වීම් සහ පුද්ගල කේන්ද්‍රීය මූලපිරීම්, මානව ශ්‍රම උත්තේජනය කිරීම්, ඉතුරුම්, ආයෝජන ක්‍රමවේද සහ තාක්ෂණික නවෝත්පාදන ක්‍රම, අවදානම් ගැනීම, ආයෝජනය කිරීම, සහ නව්‍යකරණය සඳහා ඉඩ විවර වීම ආදිය දැකිය හැකි ය. නිරන්තරයෙන් තාරුණ්‍ය සහ ග්‍රාමීය සමාජ සක්‍රීය කිරීමේ අවශ්‍යතාව වර්තමානය වන විට ප්‍රබලව දැනෙන අතර එයින් ව්‍යුක්තව සමාජ සංවර්ධන ප්‍රවේශයට අනුගත වීමෙහි අපහසුව දැකිය හැකි වේ. සමාජ බුද්ධිමතුන් සහ උපාධිධාරීනට නව සංවර්ධන ව්‍යාපෘති යටතේ සක්‍රීය කරමින් සමාජ සංවර්ධනය සඳහා මෙන්ම නිවැරදි නායකත්ව ප්‍රවේශ සඳහා ඉතා ඉක්මනින් ඔවුන්ව යෙදවීම ද ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්තීන් සකසමින් ඒවා ක්‍රියාත්මක කිරීම ද අද්‍යතනයෙහි ප්‍රබල අවශ්‍යතාවක් බවට ද පත් වී තිබෙන අතරම එමගින් රැඩිකල්වාදයේ වේගය සහ තීව්‍රතාව (Intensity of radicalism) සහන ස්වරූපයකට ගෙනයා හැකි බවත් රැඩිකල්වාදයේ වේග සහ තීව්‍රතාවන් වැඩි වන්නේ රැකියා සංඛ්‍යාව අඩු වූ විට බවත් (When the number of such jobs is fewer) ලෝක පර්යේෂණ මගින් විවර කොට තිබේ.

උපාධිධාරීන් සහ බුද්ධි සමායෝජනය පිළිබඳ වෙනදාට වඩා සිතීමට කාලය පැමිණ තිබෙන අතර තාරුණ්‍ය කළකිරීම්වලින් මුදවා ගැනීමේ ප්‍රබල කාර්ය භාරයක් ද වගකිව යුතු ආයතනවලට පැවරී තිබෙන බවත්, ඔවුන්ගේ සක්‍රීයත්වය සහ එම ශ්‍රම ආයෝජනය සංවර්ධන සමාජයකට මාර්ගය නිෂ්පාදනය කරන බවත් තාරුණ්‍ය සමාජ සංවර්ධනයෙහි සහ ජාතියෙහි ජවය සහ ආත්මය වන බවත් අප පැහැදිලි කර ගත යුතු ය.

## නිගමන සහ යෝජනා:

දේශපාලන සමාජ කරණය (Political socialization) මගින් අවට සමාජය සහ ලෝකය තුළ බලය සහ ආර්ථිකය සංවිධානය වී ඇති ආකාරය පිළිබඳව පුද්ගලයා සංජානනය සකස් කර ගනු ලබයි. මෙම දේශපාලනකරණය සරල නොවන්නේ එමගින් ගොඩනංවන දෘෂ්ටිවාදය (Ideology) පදනම්ව දේශපාලන සහ සමාජ ස්ථාවරත්වය මෙන්ම සමාජ වටිනාකම් (Values) සහ මතයන් (Ideas) ද එයට ඇතුළත් කරගන්නා බැවිනි. එමගින් ක්‍රියාත්මක වන දේශපාලන මතවාදයන් සහ සංස්කෘතීන් ද පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය කරනු ලබන අතරම එමගින් ගොඩනගා ගත යුතු දේශපාලන අරමුණු සහ දිශානතීන් පිළිබඳව ද පුද්ගලයා ව්‍යුහගත කරගනු ලබන ආකාරය පැහැදිලි ය. දේශපාලන ඉගෙනීම යනු මිනිසුන් දේශපාලනිකව පරිණත වන ක්‍රියාකාරී සහ නිෂ්ක්‍රීය, විධිමත් සහ අවිධිමත් යන ක්‍රම ඇතුළත් වන පුළුල් සංකල්පයක් වන්නාක් මෙන්ම මෙමගින් දේශපාලන ආත්මයක් (Political soul) ද පුද්ගලයා තුළ ගොඩනන්වනු ලබයි. දේශපාලන සමාජගත කිරීම යනු මිනිසුන් තම රට තුළ යහපත් පුරවැසියන් වීමට ඉවහල් වන ආකල්ප, සාරධර්ම, විශ්වාස, අදහස් සහ චර්යාවන් වර්ධනය කරන විශේෂිත දේශපාලනික ඉගැන්වීමක් බවට ද පත් වේ. 'ජාතික රාජ්‍යය බිඳ දැමීමේ ව්‍යාපෘතිය' ලෝකය තුළ මේවන විටත් ක්‍රියාත්මක වෙමින් පවතින අතරම ඒ සඳහා රාජ්‍යයන් තුළ විවිධ අර්බුද නිර්මාණය කිරීම දැකිය හැකිවන බවත්, එම

ගැටළු හා අර්බුදයන්ට අදාළ ඉතිහාසය මෙයට දශක කිහිපයකට පෙර සිට නිර්මාණය කොට ඇති බවත්, එය බොහෝ දුරටම ඩොලරයෙහි ආධිපත්‍ය මත නිර්මාණය කොට ඇති බවත්, ඒ සදහා ණය කේන්ද්‍රීය මූලය බවට පත් කොට ගෙන ඇති ආකාරයත් අපට තේරුම් ගැනීමට කාලය පැමිණ ඇති බැව් පැහැදිලි ය. ලෝක ආධිපත්‍යය අරමුණු කරගනිමින් වෛරස ව්‍යාප්තිකරණයත්, ඩිජිටල් ප්‍රජාතන්ත්‍රීයකරණය යනුවෙන් ව්‍යාපෘති මගින් ලෝකය ජාලගත කිරීමත්, ලෝකය තුළ යුධ ගැටුම් සහ සම්බාධක පනවමින් බලය අරමුණු කරගෙන ආර්ථික ගැටලු නිර්මාණය කිරීමත්, ඒ තුළ රාජ්‍ය අසංවිධිත කරමින් පුරවැසි මතභේද නිර්මාණය කිරීමත් දැකිය හැකිවන අතරම මේ පිළිබඳ අවබෝධය දේශපාලනඥයාට, ආර්ථික සහ සමාජ සැළසුම්කරුවන්ට තිබිය යුතු බවත්, මෙම ගැටලු තුළින් පුද්ගලයා සහ සමාජය ගලවාගැනීම සදහා නිවැරදි සැළසුම්කරණ සහ ප්‍රතිපත්තීන් අවශ්‍ය බවත් පැහැදිලිය. තාරුණ්‍ය සහ ග්‍රාමීය සමාජ සක්‍රීය කරමින් ඔවුනට නිෂ්පාදන ආර්ථිකයකට අවශ්‍ය මඟ පෙන්වීම සහ යොමු කර ගැනීම් අත්‍යවශ්‍ය සාධක බවට පත්වන බවත්, නිෂ්පාදන ආර්ථිකයකට අවශ්‍ය සැලසුම් නිර්මාණය කරමින් තාරුණ්‍ය සහ උපාධිධාරීන් සඳහා රැකියාවන් සහ එයට අදාළ ව්‍යාපෘතීන් නිර්මාණය කරමින් වගකීම් ලබා දීම මගින් නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය කරගැනීමට අවශ්‍ය පසුබිම ශක්තිමත් කර ගැනීමට හැකියාව ලැබෙනවා පමණක් නොව නිදහස් අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ සලසීම සහ සුරක්ෂිත රැකියා බහුල වීම මගින් තාරුණ්‍යයෙහි සහ බුද්ධිමතුන්ගේ රැඩිකල් ආවේගයන් අඩු කළ හැකි බවත්, පීඩන මානසිකත්වයෙන් මිදී දිගු කාලීන සුරක්ෂිත දේශයක් නිර්මාණය කිරීමට හැකියාව ලැබෙන බවත්, පුරවැසි සතුට එහි ඇති බවත් අප පැහැදිලි කරගත යුතුව ඇති අතරම ඒ සඳහා සක්‍රීය බුද්ධිමතුන්ගේ දායකත්වය අත්‍යවශ්‍ය බවත් එය ඕනෑම සමාජයක නිර්මාණශීලී කුසලතා ගොඩනන්වන්නක් වන බවත් අප පැහැදිලි කරගත යුතු ය.

**විමර්ශිත ග්‍රන්ථ**


Aristotle, (1944). *Politics.* Translated by Harris Rackham. Cambridge, Mass: Harvard University Press.

Bellini, P. (2019). Direct democracy and representative democracy. *Philosophy and Public Issues (New Series), Vol. (9)*1. 91-106.

Hyman, H. (1959). *Political Socialization: A Study in the Psychology of Political Behavior*. New York: Free Press.

Tangian, A. (2020). *Analytical Theory of Democracy: History, Mathematics, and Applications. Studies in Choice and Welfare.* Cham, Switzerland: Springer.

Popper, K. (April 23, 1988). The open society and its enemies revisited, *The Economist*.

Watkins, F. (1970). "Democracy". *Encyclopedia Britannica. Vol. 7.* William Benton. pp. 215–23.